**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 17/95**

මගේ අංකය: III/163/1/21/එල්/එල්/IV
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07
1995.06.13 වෙනි දින

සියලුම ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**ප්‍රසූති නිවාඩු - ආයතන සංග්‍රහය XII පරිච්ඡේදයේ**
**<u>18:1 වගන්තියට සංශෝධන</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ අවධානය ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 18 වන වගන්තියට හා 1989.03.23 දිනැති අංක 22/89 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට යොමු කරවමි. මෙම කරුණ සම්බන්ධයෙන් සඳහන් වන ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 18:1 උප වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් වගන්ති ආදේශ කරනු ලැබේ.

18:1 නිත්‍යානුකූල විවාහයකට ඇතුලත් නොවී සිටියදී රජයේ නිලධාරිනියක් අවිවාහකව දරුවෙකු බිහිකර ඇත්තේ ඇත්ත වශයෙන්ම නිලධාරිණියට පාලනය කරගත නොහැකි දූෂණය කිරීමක් හේතු කොට ගෙන නම්, ඇයට 18 වන වගන්තියේ අනිකුත් උප වගන්තිවලට යටත්ව ප්‍රසූත නිවාඩු අනුමත කිරීමට නිවාඩු අනුමත කරන බලධාරියාට හැකිය.

18:1:1 මේ සඳහා,

(අ) සිද්ධිය සිදුවූ ස්ථානය අයත් පොලිසියට හෝ ඇය පදිංචි ප්‍රදේශයට අයත් පොලීසියට හෝ නොපමාව ඒ පිළිබඳ පැමිණිල්ලක් කරනු ලැබ තිබිය යුතුය.

(ආ) එසේම අදල අධිකරණ බල ප්‍රදේශය තුළ පිහිටි මහේස්ත්‍රාත් අධිකරණයේ ඒ පිළිබඳ නඩුවක් පවරා හෝ පැවරීමට කටයුතු කර තිබිය යුතුය.

02. අංක: 18:1:1 වගන්තියේ (අ) හි සඳහන් පරිදි පොලීසියට කරන ලද පැමිණිල්ලේ සහතික පිටපතක්ද, (ආ) හි සඳහන් පරිදි නඩුවක් පවරා ඇති බවට හෝ පැවරීමට පියවර ගෙන ඇති බවට නීතිපති විසින් සහතික කරන ලද ලිපියේ පිටපතක් ද රහසිගතව නිවාඩු බලධාරියා වෙත ඉදිරිපත් කිරීම සෑහේ.

අ.කලේ/(**ආර්.එස්.ජයරත්න**)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය